# වැඩිපුර ගෙවීම් ලැබීමේ අවදානම අවම කර ගැනීම



## Reducing the Risk of Overpayment—Sinhalese

Family Tax Benefit Part A (පවුල් ආදායම් ප්‍රතිලාභ අ කොටස) Family Tax Benefit Part B (පවුල් ආදායම් ප්‍රතිලාභ අ කොටස) හෝ Child Care Benefit (ළමා සුරැකුම් ප්‍රතිලාභ) (අඩු කළ ගාස්තු) වල වැඩිපුර කරන ගෙවීම් යම් ආකාරයක සැකයක් ඇති කළ හැකි නමුදු එය සාවද්‍ය ක්‍රියාවක් පිළිබඳ චෝදනාවක් නොවන බව මතක තබා ගැනීම වැදගත් වේ.

වැඩිපුර ගෙවීම් වැඩි වශයෙන් සිදුවනුයේ පුද්ගලයින් සිය ආදායම අවතක්සේරු කිරීම නිසාය. උදාහරණයක් වශයෙන්, යමෙකු වැඩි වේතනයක් සහිත නව රැකියාවක් ලැබීම, පඩි වැඩි වීමක්, ළමා ආධාර වල ගෙවීම් වල වෙනසක් ඇති වීම, අමතර අතිකාල දීමනා, පාරිතෝෂික දීමනා හෝ තවත් පවුල් සාමාජිකයකු රැකියා ප්‍රවාහයට එකතු වීම වැනිදේ නිසා සමහරක් පවුල් මුදල් වර්ෂයක් සඳහා වැඩිපුර ආදායම් ලබනු ඇත.

### ඔබ වැඩිපුර ගෙවීම් පිළිබඳ අවදානම සම්බන්ධයෙන් ඉහළ අවදානමක සිටිය හැක්කේ ඔබේ පවුලඃ

- $42,00 සහ $61,000ක් අතර ආදායමක් ඇති; **හෝ**
- $94,000ක් හෝ ඊට වැඩි ආදායමක් ඇති විට; **හෝ**
- $140,000ක් හෝ ඊට වැඩි ප්‍රධාන ආදායමක් ඇති විට; **හෝ**
- ආදායම් උපයන්නන් එක් අයකුට වඩා වැඩි වන විට; **හො**
- නොවිඩිමත් වැඩ මුර, අතිකාල සහ පාරිතෝෂිකයන් නිසා ආදායම වෙනස් වීම නිසා; **හෝ**
- ඔබ අනියම් සේවකයකු නිසා, ඔබ කොමිස් හෝ ගිවිසුම් මත වැඩ කරන්නකු නිසා හෝ අතිරික්ත සේවකයින් ඉවත් කිරීම නිසාවෙන පාරිතෝෂික දීමනාවක් ලැබීම නිසා තක්සේරු කිරීම අසීරු ආදායමක් සහිත වීම නිසා; **හෝ**
- ආදායම ව්‍යාපාරයක් හෝ ස්වයං රැකියාවක් නිසා ලබන්නේ නම්; **හෝ**
- $12,287 ක් හෝ ඊට වඩා උපයන දරුවකු ඇතුළත් වේ නම්.

සියළුම තක්සේරු අගයන් 1/7/2008 දිනයට වලංගුව පවතී.

පවුල් වල තත්වයන් වල වෙනසක් සිදුවන විට සහ Family Assistance Office (පවුල් උපකාරක කාර්යාලය) වෙත ඒ පිළිබඳව නොදැන්වීම නිසාද වැඩිපුර ගෙවීම් ලැබීම් සිදුවනු ඇත.

### වැඩිපුර ගෙවීම් ලැබීමේ අවදානම මා අවම කරගනුයේ කෙසේද?

#### වාර්ෂික ගෙවීම් ලැබීම් පිළිබඳව සලකා බලන්න

Family Tax Benefit සහ Child Care Benefit වාර්ෂිකව ගෙවීම් ලැබීම වැඩිපුර ගෙවීම් ලැබීමේ අවදානම විශාල වශයෙන් අඩු කරනු ඇත. ඔබේ වැඩිපුර ගෙවීම් ලැබීමේ අවදානමද අඩු කරන Family Tax Benefit A හි අවම තක්සේරු අගයද ඉතුරු මුදලද වසර අවසානයේදී ලබා ගත හැක.

### දෙසතියකට වරක් Family Tax Benefit හා Child Care Benefit අඩුකල ගාස්තු ලෙස ලබා ගැනීම ඔබේ පවුලට සුදුසුම විකල්පය නම්, ඔබඃ

#### ඔබේ ආදායම් තක්සේරුව නිවැරදි මග ගන්නා බවට තහවුරු වන්න

පවුල් වල සිදුවන සියළුම වෙනස් වීම් සමගම ඔබේ ආදායම් පිළිබඳව පරික්ෂාවෙන් කටයුතු කල යුතු අතර ඔබේ ආදාටම් සම්බන්ධයෙන් යම් වෙනසක් ඇති වේ නම් Family Assistance Office දැනුවත් කිරීම අවශ්‍ය වේ. ඔබේ ආදායම වෙනස් වී ඇත්නම් ඔබට වැඩිපුර ප්‍රතිලාභ අවශ්‍ය වනු ඇති අතර සමහරක් විට ඔබ වැඩිපුර මුදල්ද ලබනු ඇත. ඔබට ලැබිය යුතු ප්‍රමාණයට වඩා ඔබ ගෙවීම් ලබන්නේ නම් මුදල් වර්ෂය අවසානයේදී ඒවා නැවත ගෙවීමට ඔබට දන්වනු ඇත.

We speak your language ✆ 13 1202

www.familyassist.gov.au

Australian Government
Family Assistance Office

Family Tax Benefit (පවුල් ආදායම් බදු ප්‍රතිලාභ) හා Child Care Benefit (ළමා සුරැකුම් ප්‍රතිලාභ) හි වැඩිපුර කරන ලද ගෙවීම් ඔබේ අනාගත Family Tax Benefit ගෙවීම් ඇතුළු වසර අවසාන අතිරේක ගෙවීම් වලින් අයකර ගත හැක. වැඩිපුර කරන ලද Family Tax Benefit ගෙවීම් ආදායම් බදු ආපසු ගෙවීම් වලින් අයකර ගනු ලැබිය හැක. ඔබ සහ ඔබේ සහකරු/කාරිය ආදායම් බදු වාර්තා ගොනු කිරීම (හෝ ඔබ ආදායම් බදු වාර්තා ගොනු කිරීම අවශ්‍ය බව Family Assistance Office වෙත දැනුම් දීම) ඉතා වැදගත්ය. සියළුම වැඩිපුර කෙරුන දීමනා නැවත සම්පූර්ණයෙන් ගෙවීම අවශ්‍යය.

## යම් වෙනසක් සිදුවුවහොත් වහාම ක්‍රියාත්මක වන්න

මෙය ඔබට නිවැරදි ලෙස ගෙවීම් කිරීම සඳහා Family Assistance Office වෙත සහය වීමට ඔබ කල යුතු ඉතා වැදගත් කාරණා වලින් එකකි.

## පහත දැක්වෙනුයේ Family Assistance Office ඇමතීම සඳහා ඔබේ සිහි කැඳවිය යුතු සියළුම වර්ගයේ දෑ පිළිබඳ කඩිනම් සෝදිසි ලයිස්තුවකි:

- පවුලේ ආදායම පිළිබඳ වෙනස් වීම්, අළුත් රැකියාවක, නැවත රැකියාවක නියුතු වීම, රැකියා අහිමි වීමක්, වැඩිපුර හෝරාවන්, පඩි වැඩි වීමක්, ව්‍යාපාරයකින් වැඩිපුර ලාභ ලැබීම, ආයෝජන ලාභාංශ, මේ සියල්ල ඔබට ගෙවිය යුතු මුදලෙහි වෙනසක් ඇති කරයි.
- ඔබේ විවාහක තත්වයේ වෙනසක් ඇති වීම.
- දරුවකු ඔබේ රැකවරණය තුළට හෝ ඉන් ඉවතට යාම.
- දරු සහය ගෙවීම් වල වෙනස් වීම්.
- ඔබ ඕස්ට්‍රේලියාවෙන් පිටත් වේ නම් (කෙටි ගමන් හා නිවාඩු ඇතුළුව).
- ඔබේ ළමා සුරැකුම් සැලසුමේ වෙනසක් ඇති වේ නම්.
- දරුවකු පාසල් ගමන ආරම්භ හෝ අවසන් කරයි නම්.
- බෙදා ගනු ලැබූ සුරැකුම් තත්වයන් වෙනස් වේ නම.
- ඔබේ අවුරුදු 16ට වැඩි දරුවා $12,287ක් හෝ ඊට වඩා වැඩියෙන් උපයන්නේ යැයි ඔබ සිතන්නේ නම්.
- ඔබේ ලිපිනයේ වෙනසක් ඇති වෙයි නම්.

## Family Assistance Office වෙත ඕනෑම වෙනසක් පිළිබඳ දැනුම් දීමට හෝ වැඩි විස්තර සඳහා:

- සිංහල භාෂාවෙන් තොරතුරු ලබා ගැනීම සඳහා දුරකථන අංක **13 1202** මගින් සඳුදා සිට සිකුරාදා දක්වා පෙ.ව 8.00 සහ ප.ව 5.00 (EST) Family Assistance Office (පවුල් උපකාරක කාර්යාලය) අමතන්න.
- **www.familyassist.gov.au** වෙබ් අඩවියට පිවිසෙන්න.
- ඔබට ආසන්නයේම ඇති Medicare Australia කාර්යාලයන් Centrelink පාරිභෝගික සේවා මධ්‍යස්ථානයන් සහ ආදායම් බදු කාර්යාලයන්හි පිහිටා ඇති Family Assistance Office වෙත පිය නගන්න.